# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 48 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 දෙසැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

# 1983 අංක 48 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 08 වන දින.]

එල්. ඩී.—ඕ. 53/83

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත, 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත, මහා නගර සභා ආඥා පනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම පිණිස ද, පළාත් පාලන ආයතනවලට කරනු ලබන ඇතැම් තෝරා පත්කර ගැනීම් සහ පළාත් පාලන ආයතනවල ඇතැම් සභිකයන්ගේ ක්‍රියා වලංගු කිරීම පිණිස ද වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1983 අංක 48 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතට කරනු ලබන සංශෝධන

**2.** (මේ පනතේ මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 262 වන අධිකාරයේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ (v) වන සහ (vi) වන අනුඡේද වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(v) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක පහත දැක්වෙන ධුරයක් දරන රජයේ නිලධරයෙක් :—

(අ) 1970 නොවැම්බර් මස 18 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 6,720 කට නොඅඩු වූ හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇති කරන ලද යම් ධුරයක් ; හෝ

(ආ) 1970 නොවැම්බර් මස 18 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධුරයක් සම්බන්ධයෙන් වන විට, ඒ ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (අ) විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නො

ඒ 073517—12,050 (83/11)

අඩු වන්නේ නම් හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක දී ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධුරයක් ;

(vi) යම් රාජ්‍ය සංස්ථාවක පහත දැක්වෙන ධුරයක් දරන නිලධරයෙක් :—

(අ) 1970 නොවැම්බර් මස 18 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 7,200 කට නොඅඩු වූ හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇති කරන ලද යම් ධුරයක් ; හෝ

(ආ) 1970 නොවැම්බර් මස 18 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධුරයක් සම්බන්ධයෙන් වන විට, ඒ ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (අ) විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක දී ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධුරයක් ;" ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වන විට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 6,720 ට අඩු හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපකට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට අඩු වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් එදිනට දරන ; හෝ

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වන විට, ඒ තනතුර ඇති කරන ලද දිනයේ දී ඉහත (i) වන ඡේදයේ සඳහන් තනතුරකට අදාළ වන වැටුප්

පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වූ හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක් යටතේ ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන වාර්ෂික වැටුපකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් අදාළ වන තනතුරක් දරන

යම් තැනැත්තකු ප්‍රශ්නයට අදාළ ඡන්ද විමසීම කරනු ලබන අවස්ථාවේ දී ඔහු තෝරා පත් කරනු ලැබීමට අපේක්ෂා කරන පළාත් පාලන ආයතනයේ සේවකයකු නොවේ නම් හෝ ඒ ඡන්ද විමසීමට පෙරාතුවම වූ වර්ෂයක කාල පරිච්ඡේදය තුළ දී ඔහු ඒ පළාත් පාලන ආයතනයේ සේවකයකුව නොසිටියේ නම් එවැනි තැනැත්තකුට මෙහි අඩංගු විධිවිධාන කිසිවක් ව්‍යාප්ත නොවන්නේ ය ; හෝ ".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (4) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත නාමයෝජනා පත්‍රයේ පිටසන් කරනු ලැබිය යුතු අතර එවැනි සෑම අපේක්ෂකයකු විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් නාමයෝජනා පත්‍රයට අමුණනු ලැබිය යුතු ය. ".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ඇ) නාමයෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ කැමැත්ත නාමයෝජනා පත්‍රයක පිටසන් කර නොමැති අවස්ථාවක, නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව නාමයෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ දිවුරුම හෝ ප්‍රතිඥාව නාමයෝජනා පත්‍රයට අමුණා නොමැති අවස්ථාවක, එම නාමයෝජනා පත්‍රය ; හෝ ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වගන්තියේ (5) වන සහ (6) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'(5) ඒ තොරතුර ලැබුණු විට අමාත්‍යවරයා විසින්, ඒ පුරප්පාඩුව පිරවීමට එම ආයතනයේ සභිකයකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා මේ ආඥාපනත යටතේ සුදුසුකම් ඇති තැනැත්තකු නාමයෝජනා කරන ලෙස එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගෙන් හෝ එම ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් හෝ ඉල්ලා සිටිය යුතු ය. එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ මේ උපවගන්තිය යටතේ කරනු ලබන යම් නාම යෝජනාවක් සමග ඒ පුරප්පාඩුව පිරවීම සඳහා නාමයෝජනා කරනු ලැබූ තැනැත්තා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් විය යුතු ය. ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව සමඟ වූ ඒ නාම යෝජනාව ලැබුණු විට, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඒ පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් ඒ තැනැත්තා පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ සියලු කාර්ය සඳහා සභිකයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද, ඊට ඉහතින් ම වූ ඡන්ද විමසීමේ දී තෝරා පත්කර ගනු ලැබූ සභිකයන්ගේ වර්තමාන ධුර කාලය ඉකුත් වන තෙක් පමණක් ඒ තැනැත්තා ධුරය දැරිය යුතු ය:

එසේ වුවද ඒ පුරප්පාඩුව පිරවීම සඳහා තැනැත්තකු නාම යෝජනා කරන ලෙස පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලීමක් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත සහ ඉහත කී ආකාරයෙන් එසේ කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, නත් කාර්යය කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් අවස්ථාවක දී, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මැතිවරණ කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය. ඒ පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා, ඊට ඉහතින්ම වූ ඡන්ද විමසීමේ දී තෝරා පත්කර ගනු ලැබූ සභිකයන්ගේ ධුර කාලය ඉකුත් වන තෙක් පමණක්, තම ධුරය දැරිය යුතු ය.

(6) පළාත් පාලන ආයතනයක සභිකයන් පිළිබඳ ඡන්ද විමසීමක් පැවැත්වීමට අදාළ මේ ආඥාපනතේ විධිවිධාන, අටවන උපලේඛනයෙහි දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව, (5) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) යම් පළාත් පාලන ආයතනයක පුරප්පාඩුවක් පිරවීම සඳහා (5) වන උපවගන්තිය යටතේ ඡන්ද විමසීමක් පැවැත්වූ විට එම පළාත් පාලන ආයතනයේ නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති තනතුරු හිස්ව ඇති අවස්ථාවක, මැතිවරණ නිලධරයා විසින්, එම ඡන්ද විමසීමෙන් පසුව එම පළාත් පාලන ආයතනයේ සභිකයන් බහුතරයක් සිටින පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයේ පළමුවැන්නා හා දෙවැන්නා වශයෙන් නම් දැක්වෙන සභිකයන් එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා ලෙස තේරී පත් වූ බව එම ඡන්ද විමසීමෙන් පසුව ප්‍රකාශයට පත් කළ යුතු ය.

(8) යම් පළාත් පාලන ආයතනයක පුරප්පාඩුවක් පිරවීම සඳහා (5) වන උපවගන්තිය යටතේ ඡන්ද විමසීමක් පැවැත්වූ පසුව, එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනකට එම පළාත් පාලන ආයතනයේ සභිකයන් බහුතරයක් සිටින අවස්ථාවක, (7) වන උපවගන්තිය යටතේ නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා තේරී පත් වූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ කවර පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍රයෙන් ද යන වග, මැතිවරණ නිලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට ඔහු ඉදිරියේ කුසපත් ඇදීමෙන් තීරණය කළ යුතු ය.

(9) (7) වන සහ (8) වන උපවගන්තිවල, පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යෙදුණු විට "නාම යෝජනා පත්‍රය" යන්නෙන්, එම පළාත් පාලන ආයතනයේ සභිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රය හෝ ඒ නාම යෝජනා පත්‍රයේ නම් දැක්වෙන සියලු දෙනාම තේරී පත් වී ඇති අවස්ථාවක හෝ ඒ ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, (5) වන උපවගන්තිය යටතේ පවත්වන ලද ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රය අදහස් වේ.'.

**6.** හත්වන උපලේඛනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනය වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි අටවන උපලේඛනය ඇතුළත් කිරීම.

'අටවන උපලේඛනය [65 අ (6) වගන්තිය]

1. ආඥාපනතේ 28(2) වන වගන්තියෙන්

"නගරාධිපතිවරයා සහ උප නගරාධිපතිවරයා ද ඇතුළුව" යන වචන අත්හරිනු ලැබූ ලෙස.

2. 28(3) වන වගන්තිය ආඥාපනතින් අත් හරිනු ලැබූ ලෙස.

3. ආඥාපනතේ 36(1) (ආ) වගන්තියේ (i) සහ (ii) අනුඡේද වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබූ ලෙස :—

"ඒ පළාත් පාලන ආයතනයෙහි පුරවනු ලැබිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවට සමාන, ඒ නාමයෝජනා පත්‍රයෙහි දැක්වෙන අපේක්ෂකයන්ගේ නම් සඳහන් වී තිබෙන අනුපිළිවෙළ අනුව අපේක්ෂකයන් තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශ කළ යුතු ය.".

4. ආඥාපනතේ 38(1) (ආ) සහ 45(1) (ආ) වගන්තිවලින් "නගරාධිපතිවරයා හා නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් හා" යන වචන අත්හරිනු ලැබූ ලෙස.

5. ආඥාපනතේ 65(1) (අ) වගන්තියෙන් "නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා සහ" යන වචන අත්හරිනු ලැබූ ලෙස.

6. 65 (1) (ආ) වගන්තිය ආඥාපනතින් අත්හරිනු ලැබූ ලෙස.

7. ආඥාපනතේ 65(2) (අ) වගන්තියෙන් "වෙනත්" යන වචනය අත්හරිනු ලැබූ ලෙස.

8. ආඥාපනතේ 65 (2) (ආ) වගන්තියෙන් "නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා හැර" යන වචන අත්හරිනු ලැබූ ලෙස.

9. ආඥාපනතේ 65(2) (ඇ) වගන්තියෙන් "(නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අපේක්ෂකයන් හැර)" යන වචන අත්හරිනු ලැබූ ලෙස.

10. ආඥාපනතේ 66 වන වගන්තිය වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබූ ලෙස :—

"ප්‍රතිඵලය පළකිරීම.

66. 65අ(5) වන වගන්තිය යටතේ පවත්වන ලද යම් ඡන්ද විමසීමක ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසු තේරීම් භාර නිලධරයා විසින්—

(අ) සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් සඳහන් කෙරෙන දැන්වීමක් පළකළ යුතු ය ; තවද

(ආ) ඡන්ද ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා මඟින් ප්‍රතිඵලය කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර, ප්‍රතිඵලය පිළිබඳ වාර්තාව ඔහුට ලැබුණ පසු, සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් වහාම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට ඔහු විසින් සැලැස්විය යුතු ය."'.

පළාත් පාලන ආයතනවලට ඇතැම් තෝරා පත් කර ගැනීම් සහ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ ඇතැම් ක්‍රියා වලංගු කිරීම.

7. (1) 1982 ජනවාරි මස 1 වන දිනයට පසු දිනයක් වන සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව යම් ඡන්ද විමසීමක් පවත්වන දිනයෙහි යම් තැනැත්තකු—

(අ) වර්ෂයකට රු. 6,720 ක් හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක ධුරයක් දරන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක රජයේ නිලධරයකු ;

(ආ) වර්ෂයකට රු. 7,200 ක් හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක ධුරයක් දරන යම් රාජ්‍ය සංස්ථාවක නිලධරයකු ; හෝ

(ඇ) වර්ෂයකට රු. 6,720 ක් හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක ධුරයක් දරන පළාත් පාලන සේවයේ සාමාජිකයකු

වීමේ හේතුව නිසාම, ඒ තැනැත්තා පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමෙන් නුසුදුස්සකු වූයේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පළාත් පාලන ආයතනයක සභිකයකු 1982 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය තුළ යම් අවස්ථාවක දී—

(අ) වර්ෂයකට රු. 6,720 ක හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක බුරයක් දරන යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වක නිලධරයකු ;

(ආ) වර්ෂයකට රු. 7,200 ක හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක බුරයක් දරන යම් රාජ්‍ය සංස්ථාවක නිල ධරයකු ; හෝ

(ඇ) වර්ෂයකට රු. 6,720 ක හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පරිමාණයක බුරයක් දරන පළාත් පාලන සේවයේ සාමාජිකයකු

වීමේ හේතුව නිසාම, යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් අපුත් ගැනීමෙන් හෝ ඡන්දය දීමෙන් හෝ නුසුදුස්සකු නොවූ ලෙස හෝ නුසුදුස්සකු නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සමග කියවිය යුතු 9(1) (ඇ) (v) හෝ (vi) වන වගන්තිය හෝ 9(1) (ඒ) වන වගන්තිය ක්‍රියාත්මකවීමේ හේතුවෙන් උද්ගත වන යම් පළාත් පාලන ආයතනයක යම් පුරප්පාඩුවක් පිරවීමට පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව යම් තැනැත්තකුගේ පත්වීම සම්බන්ධයෙන් (2) වන උප වගන්තියේ කිසිවක් බලපෑ ඇති ලෙසට හෝ බලපාන ලෙසට සලකනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි "පළාත් පාලන ආයතනය" යන්නට ප්‍රධාන ප්‍රඥප්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

## II වන කොටස

## 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනතට කරනු ලබන සංශෝධන

8. (මේ පනතේ මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනතේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 20 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි, "අනුව්‍යවස්ථාවේ (අ), (ඇ), (ඈ), (ඉ)" යන වචන වෙනුවට "අනුව්‍යවස්ථාවේ (අ), (ඇ), (ඈ) (i), (ii), (iii), (iv), (v), (vi), (ix) සහ (x), (ඉ)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (ආආ) ඒ තැනැත්තා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක පහත දැක්වෙන ධුරයක් දරන රජයේ නිලධරයකු නම්—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 6,720 කට නොඅඩු වූ හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇති කරන ලද යම් ධුරයක් ; හෝ

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධුරයක් සම්බන්ධයෙන් වන විට ඒ ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (i) වන අනුඡේදයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක දී ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධුරයක් ; හෝ

(ආආආ) ඒ තැනැත්තා යම් රාජ්‍ය සංස්ථාවක පහත දැක්වෙන ධුරයක් දරන නිලධරයකු නම්—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 7,200 කට නොඅඩු වූ හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙර ඇති කරන ලද යම් ධුරයක් ; හෝ

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධුරයක් සම්බන්ධයෙන් වන විට, ඒ ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (i) වන අනුඡේදයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් හෝ තදනන්තරව කරනු

ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක දී ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධුරයක් ; ” ; සහ

(ඇ) ඒ වගන්තියේ (ඌ) ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

“එසේ වුව ද—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වන විට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 6,720 ට අඩු හෝ යම් තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනය යටතේ ඒ ආරම්භක වැටුපකට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට අඩු වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් එදිනට දරන ; හෝ

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වන විට, ඒ තනතුර ඇති කරන ලද දිනයේ දී ඉහත (i) වන ඡේදයේ සඳහන් තනතුරකට අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නො අඩු වූ හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයක් යටතේ ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන වාර්ෂික වැටුපකට නො අඩු වූ වැටුප් පරිමාණයක් අදාළ වන තනතුරක් දරන

යම් තැනැත්තකු ප්‍රශ්නයට අදාළ ඡන්ද විමසීම කරනු ලබන අවස්ථාවේ දී ඔහු තෝරා පත් කරනු ලැබීමට අපේක්ෂා කරන සංවර්ධන සභාවේ සේවකයකු නොවේ නම් හෝ ඒ ඡන්ද විමසීමට පෙරාතුවම වූ වර්ෂයක කාල පරිච්ඡේදය තුළ දී ඔහු ඒ සංවර්ධන සභාවේ සේවකයකුව නොසිටියේ නම් එවැනි තැනැත්තකුට මෙහි අඩංගු විධිවිධාන කිසිවක් ව්‍යාප්ත නොවන්නේ ය ; හෝ ”.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

“ (2) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම අපේක්ෂකයකු විසින් ම, ආඥාපනුම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව, අවස්ථෝචිත පරිදි දිවුරුම්

දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥ දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් නාමයෝජනා පත්‍රයට අමුණනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ කැමැත්ත නාම යෝජනා පත්‍රයේ පිටසන් කර නොමැති අවස්ථාවක, නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත් වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ දිවුරුම හෝ ප්‍රතිඥාව නාමයෝජනා පත්‍රයට අමුණා නොමැති අවස්ථාවක ඒ නාමයෝජනා පත්‍රය ; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (6) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'(6) ඒ තොරතුර ලැබුණු විට, ආසනය හිස් කළ සභිකයා අයත් වූයේ යම් දේශපාලන පක්ෂයකට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමකට ද, ඒ දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සාමාජිකයකු නාම යෝජනා කරන ලෙස ඒ පක්ෂයේ ලේකම්ට හෝ කණ්ඩායමේ නායකයාට හෝ කොමසාරිස්වරයා විසින් නියම කළ යුතු ය. ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ඒ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ මේ උපවගන්තිය යටතේ කරනු ලබන යම් නාම යෝජනාවක් සමග, ඒ පුරප්පාඩුව පිරවීමට නාම යෝජනා කරනු ලැබූ තැනැත්තා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත් වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව, අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥ දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් විය යුතු ය. ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව සමග වූ ඒ නාම යෝජනාව ලැබුණු විට, ඒ පුරප්පාඩුව ඇති වූයේ යම් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් ද, ඒ සංවර්ධන සභාව සඳහා ඒ තැනැත්තා සභිකයකු ලෙස කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කර, එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සභිකයාගේ නම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට ඔහු විසින් සැලැස්විය යුතු ය :

එසේ වුවද ඒ පුරප්පාඩුව පිරවීම සඳහා තැනැත්තකු නාම යෝජනා කරන ලෙස පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්

ඉල්ලීමක් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත සහ ඉහත කී ආකාරයෙන් එසේ කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අමාත්‍යවරයාට වහාම දැන්විය යුතු ය. ඒ තොරතුරු ඔහුට ලැබුණු විට, තත් කාර්යය කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් අවස්ථාවක දී, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය. සංවර්ධන සභාවලට ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ මේ පනතේ විධිවිධාන, මේ පනතේ හතරවන උපලේඛනයෙහි දක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව, මේ අතුරු විධානය යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමකට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් අනුව පවත්වන ලද ඡන්ද විමසීමක දී සංවර්ධන සභාවක සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු අනුප්‍රාප්ත වන සභිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු ධුරය දැරිය යුතු ය.

(7) යම් සංවර්ධන සභාවක පුරප්පාඩුවක් පිරවීම සඳහා (6) වන උපවගන්තිය යටතේ ඡන්ද විමසීමක් පැවැත් වූ විට එම සංවර්ධන සභාවේ සභාපති ධුරය හිස්ව ඇති අවස්ථාවක, තේරීම්භාර නිලධරයා විසින්, එම ඡන්ද විමසීමෙන් පසුව එම සංවර්ධන සභාවේ සභිකයන් බහුතරයක් සිටින පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයේ පළමු වැන්නා වශයෙන් නම දක්වෙන සභිකයා ඒ සංවර්ධන සභාවේ සභාපතිවරයා ලෙස තේරී පත් වූ බව එම ඡන්ද විමසීමෙන් පසුව ප්‍රකාශයට පත් කළ යුතු ය.

(8) යම් සංවර්ධන සභාවක පුරප්පාඩුවක් පිරවීම සඳහා (6) වන උපවගන්තිය යටතේ ඡන්ද විමසීමක් පැවැත්වීමෙන් පසුව, එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනකට එම සංවර්ධන සභාවේ සභිකයන් බහුතරයක් සිටින අවස්ථාවක (7) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා තේරී පත් වූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ කවර පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා පත්‍රයෙන් ද යන වග, තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට ඔහු ඉදිරියේ කුසපත් ඇදීමෙන් තීරණය කළ යුතු ය.

(9) (7) වන සහ (8) වන උපවගන්තිවල, පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යෙදුණු විට, "නාමයෝජනා පත්‍රය" යන්නෙන් එම සංවර්ධන සභාවේ සභිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය හෝ ඒ නාමයෝජනා

පත්‍රයේ නම් දැක්වෙන සියලු දෙනාම තේරී පත්වී ඇති අවස්ථාවක හෝ ඒ ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, (6) වන උපවගන්තිය යටතේ පවත්වන ලද ඡන්ද විමසීමේ දී ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි හතරවන උපලේඛනය ඇතුළත් කිරීම.

**12.** තුන්වන උපලේඛනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'**හතරවන උපලේඛනය** [65 (6) වන වගන්තිය]

1. 18(1) (ආ) වගන්තිය පනතින් අත්හරිනු ලැබූ ලෙස.
2. පනතේ 18(2) වන වගන්තියෙන් "සහ සභාපතිවරයාගේ නම" යන වචන අත්හරිනු ලැබූ ලෙස.
3. 58(1) (උ) වගන්තිය පනතින් අත්හරිනු ලැබූ ලෙස.
4. පනතේ 60 වන වගන්තියෙන් "සහ සභාපතිවරයාගේ නම" යන වචන අත්හරිනු ලැබූ ලෙස.'.

## III වන කොටස

### මහා නගර සභා ආඥාපනතට සහ නගර සභා ආඥාපනතට කරනු ලබන සංශෝධන

252 වන අධිකාරයෙහි 286අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**13.** මහා නගර සභා ආඥාපනතේ 286 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 286අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ඇතැම් අවස්ථාවල දී සභාවේ සහ නගරාධිපතිවරයාගේ බලතල කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

286අ. නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා විසින් ධුර දැරීම අවසන් කිරීමේ හේතුවෙන් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට සභාවට නොහැකි වන අවස්ථාවක, එම ධුර සම්බන්ධයෙන් පුරප්පාඩු ඇතිවීම සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම පුරප්පාඩු පිරවීම අතර ගත වන යම් කාලයක් ඇතුළත, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් සභාව, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත සතු කරනු ලැබූ හෝ පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමසාරිස්වරයාට තිබිය යුතු ය, ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය, ඉටු කරනු ලැබිය යුතු ය.".

**14.** නගර සභා ආඥාපනතේ 184 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 184අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය :—

255 වන අධිකාරයෙහි 184අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" ඇතැම් අවස්ථාවල දී සභාවේ, සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ බලතල ලේකම් විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

184අ. සභාපතිවරයා සහ උප සභාපතිවරයා විසින් ධුර දැරීම අවසන් කිරීමේ හේතුවෙන් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට නගර සභාවකට නොහැකි වන අවස්ථාවක, එම ධුර සම්බන්ධයෙන් පුරප්පාඩු ඇතිවීම සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම පුරප්පාඩු පිරවීම අතර ගතවන යම් කාලයක් ඇතුළත, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් සභාව, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙත සතුකරනු ලැබූ හෝ පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය ලේකම්වරයාට තිබිය යුතු ය. ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය, ඉටු කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.